# කෝවිඩ් -19 කුලී සහන ප්‍රතිපාදන

ගැටලු සහ පිළිතුරු

**Information in Sinhalese**

## කුලී සහන ප්‍රතිපාදන යනු කුමක්ද?

කුලී නිවාසවල ජීවත්වන පුද්ගලයන් වෙනුවෙන් වික්ටෝරියානු රජය විසින් ඩොලර් මිලියන 80ක කුලී උපකාර අරමුදලක් ස්ථාපනය කර තිබේ.

කොරෝනා (කෝවිඩ්-19) වසංගත තත්ත්වය නිසා සිය ආදායම අහිමි වූ වික්ටෝරියානුවන් වෙනුවෙන් මෙම අරමුදල වෙන් වී ඇත.

සිය නිවසේ කුලිය ගෙවීමට අපොහොසත් වන වික්ටෝරියානුවන්ට මෙම අරමුදල යටතේ ඩොලර් 3,000ක් දක්වා වන ප්‍රතිපාදන ලබා ගත හැකි වේ.

## කුලී සහන ප්‍රතිපාදන සඳහා සුදුසුකම් ලබන්නේ කවුද?

ප්‍රතිපාදන ලැබීමට ඔබ පහත සුදුසුකම් සැපිරිය යුතුය :

- නිවෙස් හිමියා සමග කුලී අඩු කිරීමට එකඟ වී වික්ටෝරියානු පාරිභෝගික කටයුතු ආයතනයේ (Consumer Affairs Victoria) නව කුලී ගිවිසුම ලියාපදිංචි කිරීම. ඔබට නිවෙස් හිමියා සමග එකඟතාවකට පැමිණිය නොහැකි නම්, වික්ටෝරියානු පාරිභෝගික කටයුතු ආයතනයේ (Consumer Affairs Victoria) සහාය ලබා ගත හැකිය.
- ඔබේ ආදායම සතියකට ඩොලර් 1,903ට වඩා අඩු විය යුතුය.
- එසේ ම, ඔබගේ ඉතිරි කිරීම් ඩොලර් 10,000ට වඩා අඩු විය යුතුය.

අයදුම්කරුවන් පුරවැසියන් හෝ ස්ථිර පුරවැසියන් වීම අවශ්‍ය නොවේ.

## මට ප්‍රතිපාදන සඳහා අයදුම් කළ හැක්කේ කෙසේද?

ඔබ වික්ටෝරියනු පාරිභෝගික කටයුතු ආයතනය (Consumer Affairs Victoria) සමග නව කුලී ගිවිසුම ලියාපදිංචි කර ඇත්නම්, ඔබට<https://rentrelief.covid19.dhhs.vic.gov.au/>. ඔස්සේ මාගර්ගතව කුලී සහන ප්‍රතිපාදන සඳහා අයදුම් කළ හැකිය.

## මෙම ප්‍රතිපාදන භාවිත කළ හැක්කේ කුමක් සඳහා ද?

ඔබගේ ප්‍රතිපාදන අනුමත වුවහොත්, අදාළ මුදල ඔබේ නව කුලී ගිවිසුම ප්‍රකාරව නිවෙස් හිමියා වෙත සෘජුව ම බැර කෙරේ.

## වැඩිදුර තොරතුරු ලබා ගත හැක්කේ කොතැනින්ද?

කෝවිඩ්-19 කුලී සහන ප්‍රතිපාදන ගැන නවතම තොරතුරු ලබා ගැනීමට
<https://www.housing.vic.gov.au/help-renting/rentrelief> වෙත යන්න.

ඔබේ නව කුලී ගිවිසුම ලියාපදිංචි කිරීමට හෝ වික්ටෝරියානු පාරිභෝගික කටයුතු ආයතනයේ (Consumer Affairs Victoria) සහාය ලබා ගැනීමට
<https://www.consumer.vic.gov.au/resources-and-tools/advice-in-a-disaster/coronavirus-covid19-and-your-rights/renting-rules-and-support-during-the-moratorium>
වෙත යන්න.

ඔබට ඉහත තොරතුරු සඳහා භාෂණ පරිවතර්කයකුගේ උපකාර අවශ්‍ය වේ නම්, 131 450 ඔස්සේ පරිවතර්න හා භාෂණ පරිවතර්න සේවා (ටිස්- නැෂනල්) Translating and Interpreting Service (TIS National) අමතන්න.

වික්ටෝරියානු රජයේ අනුමැතිය යටතේ පළ කර තිබේ. 1 Treasury Place, Melbourne.

© වික්ටෝරියා ප්‍රාන්තය, ඔස්ට්‍රේලියාව, සෞඛ්‍ය හා මානව සේවා දෙපාතර්මේන්තුව (Department of Health and Human Services) සැප්තැම්බර් 2020.

VICTORIA State Government | Health and Human Services